# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2281/16 - 2022 මැයි මස 25 වැනි බදාදා - 2022.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා. ලේ. යොමු අංකය*: DSM/YT/LAND/5/74.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/18/2019/WS/164.

විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය, යටතේ යටවත්ත පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශතාවේ විස්තර*:

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අස්ගිරි පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ මැදියාපොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නිකගොල්ල ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ මූලික පිඹුරු අංක මා 1853 හි සඳහන් හුණුවෙලකුඹුර *හෙවත්* නිසරු පැල නමැති ඉඩමේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0388 ක් වූ බිම් කොටස.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: හුණුවෙලකුඹුර *හෙවත්* නිසරු පැල; විස්තරය: විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ යටවත්ත පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත් කර ගැනීම සඳහා; හිමිකම් කියන අය: සමුන්ගේ මොහොමඩ් ලාහීර්, අංක 21/1, පමුණුදෙණිය, යටවත්ත; බිම් ප්‍රමාණය: හෙක්: 0.0388.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 අගෝස්තු මස 22 වැනි දින පූ. හා. 10.00 ට යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022 අගෝස්තු මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**ඩී. ආර්. කේ. හෙන්නායක,**
ප්‍රාදේශීය ලේකම්,
යටවත්ත.

2022 මැයි මස 17 වැනි දින,
යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 5-0109




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම

*මගේ යොමු අංකය:* KDS/AKU/4/2/1/58.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/9/2015/WS/46.

උක්ත ශීර්ෂය යටතේ 2022 පෙබරවාරි මස 25 වැනි දින අංක 2268/79 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ අංක EOG 2 - 0650 යටතේ ම විසින් පළ කරන ලද දැන්වීමෙහි සඳහන් දිනයන් හා වේලාවන් ඉවත් කොට, ඒ වෙනුවට වෙනත් දිනයන් හා වේලාවන් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉවත් කළ යුතු දිනයන් හා වේලාවන් :**

2022 අප්‍රේල් 07 වැනි දින පෙ.ව. 10.00

2022 මාර්තු 31 දින

**ඉවත් කළ දින වෙනුවට ආදේශ කළ යුතු දිනයන් හා වේලාවන්**

2022 ජූලි 27 වැනි දින පෙ.ව. 10.00

2022 ජූලි 20 වැනි දින

**ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,**
ප්‍රාදේශීය ලේකම්,
අකුරණ.

2022 මැයි මස 19 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 5-0110

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.